2022 දෙසැම්බර් 05 සඳුදා

දිනමිණ



# ශ්‍රී ලංකාවේ වත්මන් තත්ත්වය ගැන නවදිල්ලියේදී රාජ්‍ය තාන්ත්‍රිකයන් දැනුම්වත් කරයි



**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවේ වත්මන් තත්ත්වය සම්බන්ධයෙන් නවදිල්ලියේ නේවාසිකව සිටින මැදපෙරදිග මධ්‍යම ආසියානු හා දකුණු ආසියානු රටවල තානාපතිවරු හා මහ කොමසාරිස්වරු දැනුම්වත් කිරීමට ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය පියවර ගෙන තිබේ.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නවදිල්ලියේ නේවාසිකව සිටින මැදපෙරදිග මධ්‍යම ආසියානු හා දකුණු ආසියාවේ රටවල් 11ක තානාපතිවරු හා මහ කොමසාරිස්වරු කණ්ඩායමක් ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා හමු වූ බව ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය පවසයි. අසර්බයිජාන්, බහරේන්, කාම්බෝජියා, කසකස්තාන්, උතුරු කොරියාව, මොන්ගෝලියාව, සිරියා, තජිකිස්තාන්, ලෙබනන්, කිර්ගිස්තාන් හා ෆිජි යන රටවල රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීහු මේ අවස්ථාවට සහභාගී වී තිබෙන අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඉන්දියාවේ සිට කටයුතු කරන රටවල් අනූහතරක් අතුරින් කොටසක් බවද එම මහ කොමසාරිස් කාර්යාලය කියයි. මේ රටවල් අතර සබඳතා තර කරන අතර වෙළෙඳ, ආයෝජන සහ සංචාරක අංශ කෙරෙහි පුළුල් අවධානයක් යොමු කිරීම මේ හමුවීමේ අරමුණ වී තිබේ. මීට පෙරද ආසියා, යුරෝපා, ලතින් අමෙරිකානු සහ අප්‍රිකානු රටවල නියෝජිතයන් සමඟ සාකච්ඡා කළ අතර ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික හා දේශපාලන තත්ත්වය ගැනද මෙහිදී පැහැදිලි කර ඇත.